**ත්‍රිකුණාමලය නගර සභාව - 2021**

-------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

ත්‍රිකුණාමලය නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිරීක්ෂණය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නගර සභා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ පැවති රු.377,790 ක ඖෂධ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි කාලයේදී මේවා අනාවරණය කිරීමට පියවර ගනු ලැබේ. | ඖෂධ ද්‍රව්‍යවල තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

### 1.6.2 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වර්ෂ 11කට අධික කාලයක සිට පැවත එන රු.11,863,654ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි. | දෝෂ හඳුනාගැනීමෙන් පසුව ප්‍රවර්තන වර්ෂයේ අවසන් ගිණුම්වලින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළයුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) නගර සභා ආඥාපනත 255 වන අධිකාරිය | | | |
| (i) 164 වගන්තිය | සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි නේවාසිකාගාරයක්, ආපන ශාලාවක් හෝ නැවැතුම්පලක ආදායම් මත සියයට 1ක් දක්වා වූ බලපත්‍ර | නේවාසිකාගාර 5ක ගාස්තු ගෙවිය යුතු බව උපදෙස් ලබාදී ඇත. | නගර සභා ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගාස්තු අයකළ යුතු වුවත්, ඒසේ කර නොතිබුණි. | | |
| (ii) | 157(7) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ප්‍රචාරන ගාස්තු එකතුව රු. 237,200ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති අතර ප්‍රචාරක ගාස්තු නොගෙවන දැන්වීම් පුවරු ඉවත් කිරීමට පියවර ගෙන ඇත. | -එම- |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට මූලික පියවර ගෙන ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහයේ XIX පරිශිෂ්ඨයේ 6.1 වගන්තිය | රජයේ නිවාසවල වර්ෂ 05කට අධික කාලයක් පදිංචි වී සිටින නිලධාරීන් 50ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර අළුතින් අයැදුම් කළ අයට නිවාස ලබාදීමටත් කටයුතු කර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ආයතන සංග්‍රහය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | අනෙකුත් චක්‍රලේඛ<br>-------------------- | | | |
| (i) | 2018 ජූලි 19 දිනැති අංක 2018/e පළාත්පාලන- 01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මගින් සේවාවන් ලබාගැනීමට පහසුක්ම සලසා දී නොතිබුණි. | නගර සභාවට වෙනමම වෙබ්අඩවියක් සකස් කර ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | 2018 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්රලේඛය | ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යසාධනය ප්‍රතිඵල සමග එකිනෙකට සම්බන්ධ අවම වශයෙන් කාර්යසාධන දර්ශක 03ක්වත් වාර්තා කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රවර්තන වර්ෂයේ පියවර ගනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව පියවර ගත යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.2,374,395ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.28,691,748 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | වරිපනම් හා බදු | | |
| i) | නගර සභාවේ බලප්‍රදේශය තුළ නිශ්චල දේපළ 18,533ක් මත දේපළ බදු අයකිරීමට සභාව විසින් දේපළහිමිකරුවන්ට 'K' ආකෘතිය මගින් දැනුම් දීම් සිදුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා දේපළ හිමිකරුවන් 10,130කට "K" ආකෘති මගින් දැන්වීම් සිදුකර නොතිබුණි. | ඉදිරි කාලයේදි "K" ආකෘතිපත්‍ර ආදායම් පරීක්ෂකවරුන් මාර්ගයෙන් සම්පූර්ණයෙන් නිකුත් කිරිමට පියවර ගනු ලැබේ. | හිඟහිටි දේපළ බදු සම්බන්ධයෙන් "K" ආකෘති පත්‍ර දේපළ හිමිකරුවන්ට නිකුත් කළ යුතුය. |
| ii) | නගර සභාව විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවලින් සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ හිඟහිටි දේපළ බදු රු.97,870,729ක් එකතු කිරීම සඳහා නිලධාරීන් 05ක් පත්කර තිබූ නමුත් ඔවුන් විසින් වර්ෂය තුළ අයකර තිබුණේ රු.11,123,969ක් පමණි. මෙම ප්‍රමාණය හිඟහිටි වටිනාකමින් සියයට 11 ක් විය. | හිඟහිටි බදු ගෙවන්නන්ට වෙන වෙනම දැනුම්දීමේ ලිපි නිකුත් කර ඇත. | හිඟහිටි දේපළ බදු අයකිරීමට පියවර ගත යුතුය. |
| iii) | නගර සභාව විසින් අවසන් වරට වරිපනම් බදු තක්සේරු කර තිබුණේ 2009 වර්ෂයේදීය. එසේම, වාර්ෂික වටිනාකමින් අයකරනු ලබන ප්‍රතිශතය සියළුම දේපළ සඳහා සියයට 6ක් පමණක් වී තිබුණි. | ප්‍රාදේශීය තක්සේරු දෙපාර්තමේන්තුවේ වෙනමම කමිටුවක් පත්කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | දේපළ ප්‍රත්‍යාගණනය කර එයට අනුකූලව දේපළ බදු අයකළ යුතුවේ. |
| (ආ) | කුලී | | |
| i. | කඩකාමර 167ක් කුලියට ලබාදී තිබුණත් ඉන් කඩකාමර 21ක් සඳහා ගිවිසුම් අත්සන් කර බදුකාලය සඳහන් නොකර දීර්ඝකාලීන බදු දී තිබුණි. | 2020 සහ 2021 වර්ෂයන්හි කිසිවෙකුත් බදු ලබානොගත් හේතුවෙන් ආදායම් අහිමිවීම වලක්වා ගැනීමට පෙර වර්ෂයේ බද්දට ලබාගත් බදුකරුවන් 21ටම නැවතත් එය ලබාදීමට පියවර ගෙන තිබුණි. | බදු ගිවිසුම් අත්සන් කිරීමේදී කොන්දේසි පැහැදිලිව ඇතුලත් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | මධ්‍යම වෙළෙඳපොළ සංකීර්ණයේ පිහිටි කඩකාමර 176කින් 2009 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් හිඟකුලී රු.17,480,539ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | 2022 වර්ෂ කාලපරිච්ඡේදයේ හිඟහිටි රු. 254,130ක් අයකර ගෙන ඇත. | හිඟහිටි අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| iii. | ඒසේම වසර 13 කට පෙර සිදු කළ තක්සේරුව පදනම් කර ගනිමින් කුලී අයකරමින් පැවතුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් එම කඩකාමර තක්සේරු කිරීමෙන් පසුව නව කඩකුලී වටිනාකම නියම කරනු ලැබේ. | කඩකාමර කුලී තක්සේරු කර නව කුලී වටිනාකම නියම කළ යුතුය. |
| iv. | මධ්‍යම වෙළෙඳපොළ සංකීර්ණයේ කඩකාමර 215ක් පැවැති නමුත් 2009 වර්ෂයේ සිට කඩකාමර 48ක් කුලියට ලබාදී නොතිබුණි. මේ හේතුවෙන් එකතුව රු.33,186,816ක ආදායම් අහිමි වී තිබුණි. | කඩකාමරවල ස්වරූපය වෙනස් කර මේවා සංචාරක නිකේතනයක් ලෙස වෙනස් කිරීමට පියවර ගනිමින් පවතී. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සුවය පහසුකම් සහ සුහසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **රජයේ නිලධාරීන්ගේ නිවාස** | | |
| i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගෙන් වසර 10 කට අධික කාලයක සිට පැවත ඒන අවස්ථා 109 කට අදාළව රු.833,819 ක නිවාස කුලී අයකරගතයුතුව පැවතුණි. | රජයේ නිවාස කුලී හිඟමුදල් නොගෙවූ අයට නඩු පැවරීමට සාක්ෂි විමසමින් පවතින අතර දැනුම්දීමේ ලිපිත් නිකුත් කර ඇත. | හිඟහිටි රජයේ නිවාස කුලී අයකිරීමට පියවර ගත යුතුය. |
| ii) | නගර සභා ආඥා පනතේ 255 අධිකාරියේ 171 වගන්තියට පටහැනි ලෙස රු.7,617,690ක් වූ කඩකාමර කුලී කපාහැර තිබුණි. | කඩකාමර හිඟකුලී රු.7,617,690ක් අත්හැරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය සඳහා යවා ඇත. එසේ වුවත්, ඇතැම් අපැහැදිලි කාරණා පැවැතීම නිසා ඒවා නිවැරදි කර නැවත අනුමැතියට යවා ඇත. | ආදායම් කපාහැරීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා | අනෙකුත් අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීමට කටයුතු කරමින් පවතී. | අතුරු ව්‍යවස්ථා පනවා අවශ්‍ය නියාමන කටයුතු සිදු කළයුතුය. |

අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දින දක්වා කාරණා 05ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) නඩත්තුව සහ අළුත්වැඩියා සිදුනොකිරීම** | | |
| නගර සභාවට අයත් වාහන 45ක් වර්ෂ 02 සිට 15ක් දක්වා කාලයක සිට අළුත්වැඩියා සිදුකිරිමට කටයුතුව තිබුණත්, මේ දක්වා අළුත්වැඩියා කිරීමට හෝ වෙනදේසියේ විකිණීමට හෝ කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | බහුතර වාහන සංඛ්‍යාවකට අවශ්‍ය අමතර කොටස් නොමැති වීම හේතුවෙන් ඒවා අළුත්වැඩියා කිරිමට නොහැකිවී පැවැතුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ) පවරා නොගත් වත්කම්/ හිමිකාරිත්වය මාරු නොකළ වත්කම්** | | |
| වාහන 51ක් වර්ෂ 03 සිට 35ක් දක්වා කාලයක් නගර සභාව විසින් භාවිතා කර තිබූ නමුත් නගර සභාවේ නමට හිමිකාරිත්වය මාරු කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම වාහන ලියාපදිංචි පොත් සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව පොලීසියේ පැමිණිලි කිරිමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | -එම- |
| **(ඇ) නිෂ්කාර්ය/ඌන උපයෝජිත වත්කම්** | | |
| රෝහල් අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා සවිකළ රු.5,695,830 ක් වූ යන්ත්‍රය, 2018 වර්ෂයේ සිට මේ දක්වා නිෂ්කාර්යව පැවැතුණි. | මෙම යන්ත්‍රය කමිටුවක් පත්කර වෙන්දේසියේ විකිණීමට තීරණය කර තිබුණි. | -එම- |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| i) ප්‍රාථමික මට්ටමේ තනතුරු 49ක පුරප්පාඩුත්, ද්විතියික පදනමේ නිලධාරී මට්ටමේ තනතුරු 19ක පුරප්පාඩුත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02ක පුරප්පාඩුත් ඇතුළු සම්පූර්ණ පුරප්පාඩු 70ක් පිරවීමට පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii) | සභාවේ ලේකම් සහ ගණකාධිකාරි තනතුරු වර්ෂ 05කට අධික කාලයක සිට පැවැතුණත්, ඒ සඳහා සුදුසු පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරීන් අනුයුක්ත කරවාගෙන නොතිබුණි. | අපගේ සභාවේ ලේකම් සහ ගණකාධිකාරි තනතුරු සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් පළාත්පාලන කොමසාරිස්වරයා මාර්ගයෙන් නැගෙනහිර පළාත් සභා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා (පරිපාලන) වෙත ඉදිරිපත් කර ඇත. | -එම- |

(ආ) සේවක ණය

---------------

| | | |
|---|---|---|
| සේවක ණය ලේඛනය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවැති හිඟහිටි ශේෂය තුළ 1993 වර්ෂයේ සිට 2000 දක්වා කාලපරිච්ඡේදයේ සේවය කළ සේවකයින්ගේ හිඟ ණයශේෂ රු.729,545ක් ද ඇතුලත් වී තිබුණි. | මෙම ණය මුදල විධිමත් පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 30 දිනැති අංක PT/12/2020 දරන නැගෙනහිර පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව මූල්‍ය ප්‍රකාශන පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2022 අප්‍රේල් 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ඉදිරිකාලයේදි අවසන් ගිණුම් සභාවේ අනුමැතිය ලබා නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | නියමිත දිනට ප්‍රථම මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණු බැවින් අභ්‍යන්තර විගණන කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | වර්තමානයේ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර රාජකාරී ලැයිස්තුව ලබාදී ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

4.3 **විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර තිබුණත්, එහි ක්‍රියාකාරකම් විධිමත්ව ඉටුකර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ 1 වැනි සහ 2වැනි කාර්තු සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා තිබුණු බව සඳහන් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |